ශීර්ෂය **26** - තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 30 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවට අදළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 30 වන දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ **1.6** ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම**,** විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකිම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාචෝචිතව උචිත
  විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම් ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව විසින් ඉකුත් වර්ෂයට අදාලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

## 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ප්‍රමාණාත්මක ගිණුම්කරණ අඩුපාඩු අනාවරණය විය.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 දෙසැම්බර් 31 දිනට ඉතිරි අග්‍රිමය මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කර තිබුණද, 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මුදල් හා මුදල් සමාන දෑ ලෙස රු. 937,541 ක් සටහන් කර තිබුණි. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව ගිණුම් පිළියෙල කළ යුතුය. | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මුදල් හා සමාන දෑ ලෙස රු.937,541.41 ක මුදලක් අප විසින් සටහන් කිරීමට කටයුතු කරන ලද්දේ ගිණුම් සකස් කිරීමේදී භාණ්ඩාගාර ගිණුම් ශේෂයන් හා සැසඳෙන පරිදි ගිණුම් වාර්තා ඉදිරිපත් කළයුතු බැවිනි. |
| (ආ) | 2018 දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාව විසින් හඳුනා ගෙන ගිණුම් ගත නොකළ බැරකම්වල වටිනාකම රු. 178,411 ක් විය. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව ගිණුම් පිළියෙල කළ යුතුය. | ඉහත ගෙවීම් 12/31 දිනට හඳුනාගත් බැරකම් ලෙස මූල්‍ය ප්‍රකාශනයන්ට ඇතුලත් විය යුතු බව පිළිගන්නා අතර ඉදිරියේදී මෙම අඩුපාඩු නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |

## 1.6.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය<br>නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම | කොමිෂන් සභාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර කොමිෂන් සභාවේ බලතල කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේදී දරනු ලබන | පනතේ විධිවිධාන ප්‍රකාරව ක්‍රියා කළ යුතුය. | භාණ්ඩාගාරය සමඟ වැඩිදුරටත් සාකච්ඡා කර, කොමිෂන් සභා අරමුදල පිහිටුවීමට පියවර ගනු ලබන බව දන්වමි. |

| | | | | |
|---|---|---|---|---|
| | පිළිබඳ පනතේ 11(2) හා 16(1) වගන්ති | වියදම් එම අරමුදලින් ගෙවනු ලැබිය යුතු විය. එසේ වුවද, කොමිෂන් සභාව, විශේෂ වියදම් ඒකකයක් ලෙස සලකා විසර්ජන පනතින් ප්‍රතිපාදන වෙන් කර දී තිබුණු අතර එවැනි අරමුදලක් පිහිටුවා ඇති බවටද විස්තර විගණනයට ඉදිරිපත් නොවීය. | | |
| (ආ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය | ආයතනයේ මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික කාර්යසාධන වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවද, කොමිෂන් සභාව විසින් එම කාර්යසාධන වාර්තාව මෙතෙක් ඉදිරිපත් කර නොතිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව ක්‍රියා කළ යුතුය. | මූල්‍ය ප්‍රකාශන/ගිණුම් ප්‍රකාශන මුල්වතාවට ඉදිරිපත් කරන ලද බැවින් වාර්ෂික කාර්යය සාධන වාර්තාව පිළියෙල කිරිම අතපසු වී ඇත. ඉදිරි වර්ෂයේදී මෙම අඩුපාඩු සකස් කර ගැනීමට ක්‍රියා කරනු ලබන බව දන්වමි. |

### 1.6.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | අදාල සමාලෝචනයන් සිදුකර එහි පිටපතක් විගණනය වෙත යොමු කළ යුතුය. | කොමිෂන් සභාව මඟින් එම අභ්‍යන්තර පාලන පද්ධතිය පිළිබඳව හැකි පරිදි නිරන්තර සමාලෝචනයක් සිදුකර ඇත. මෙම සමාලෝචනයන් විගණකාධිපති වෙත වාර්තා කිරිම පමණක් සිදුවී නොමැත. |
| (ආ) | වාර්ෂික සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරිම සිදු වන බවට ප්‍රධාන | අස්ථිත්වයට අදාල වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය. | වාර්ෂික හා වෙනත් මූල්‍ය ප්‍රකාශ නිසි කාලය ඇතුළත පිළියෙල කිරීම සිදු කරන ලදී. එහෙත් |

| | | | |
|---|---|---|---|
| | ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු අතර, ඊට අමතරව විගණනය කරනු ලබන ආස්ථිතයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වගබලාගත යුතු වුවත්, වාර්තාවේ 3.1.3 ඡේදයේ සඳහන් විගණන නිරීක්ෂණ හේතුවෙන් එම අවශ්‍යතා ඉටු කර නොතිබුණි. | | කොමිෂන් සභාව ආරම්භ කර ඇත්තේ 2016 ඔක්තෝබර් මාසයේ බැවින් 2016 වර්ෂය සඳහා වාර්තාවක් සකස් කර නොමැත. |
| (ඇ) | අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ 4.2 ඡේදයේ සඳහන් නිරීක්ෂණ අනුව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි. | අභ්‍යන්තර විගණන කර්තව්‍යයන් නිසි පරිදි ක්‍රියාත්මක කළ යුතුය. | ඉදිරියේදී කොමිෂන් සභාව තුළ අභ්‍යන්තර විගණන කටයුතු කිරීමට අපේක්ෂා කෙරේ. |

**2. මූල්‍ය සමාලෝචනය**
---------------------

**2.1 වියදම් කළමනාකරණය**
-------------------------

**2.1.1 ඇස්තමේන්තු සකස් කිරීමේ දුර්වලතා - වියදම්**
-----------------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පුනරාවර්තන වැය විෂයයන් 03 ක් හා මූලධන වැය විෂයයක් සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් වෙන් කරන ලද එකතුව රු. 1,527,704 ක් වූ සම්පූර්ණ ප්‍රතිපාදනයම වර්ෂය තුළ ඉතිරි වී තිබුණි. | අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගත යුතුය. | කොමිෂන් සභාව විසින් තම වාර්ෂික වියදම් ඇස්තමේන්තුව ඉදිරිපත් කළ මුල්ම අවස්ථාව මෙය වන අතර නිපුණතාවයක් සහිත නිලධාරින් සභාව තුළ නොසිටීම නිසා 2018 වර්ෂයේ කාර්යභාරය ඉටුකිරීම වෙනුවෙන් අවශ්‍ය වන මූල්‍ය ඇස්තමේන්තු එම නිලදාරීන්ට විධිමත් පරිදි සකස් කිරීමට නොහැකි වී ඇත. |
| (ආ) | 2018 දෙසැම්බර් 31 දිනට වැය විෂයයන් 13 ක් යටතේ රු. 37,627,396 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් | අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගත | අවම වශයෙන් එක් පෙර වර්ෂයක හෝ ඉටුකරන ලද කාර්යයන්ට අදාළ වැය ඇස්තමේන්තු පැවතුනි නම් |

| | | |
|---|---|---|
| රු.18,698,206 ක් පමණක් වියදම් කර තිබුණි. ඒ අනුව ඉතිරිය වූ රු. 18,929,190 ක අධි ප්‍රතිපාදන සැලසීම හේතුවෙන් එය වෙන් කරන ලද ප්‍රතිපාදනයෙන් සියයට 18 සිට සියයට 95 දක්වා වූ පරාසයක විය. | යුතුය. | මෙයට වඩා විධිමත්ව වියදම් පුරෝකතනය කර වැය ඇස්තමේන්තු සකස් කිරීමට ඔවුනට හැකි වේ යැයි විශ්වාස කරමි. ඉදිරි වර්ෂවලදී කොමිෂන් සභාවේ ඇස්තමේන්තු සකස් කිරීමේදී මේ සම්බන්ධව වඩාත් සැලකිලිමත්ව වැය ඇස්තමේන්තු සකස් කිරීමට පියවර ගන්නා බවද සඳහන් කරමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කාර්යසාධනය

### 3.1.1 සැලැසුම් කිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කොමිෂන් සභාව විසින් 2018 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණද, එය 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 රාජ්‍ය මුදල් චක්‍රලේඛ අවශ්‍යතාවයන්ට අනුකූල වන පරිදි පිළියෙල කර නොතිබුණි. | චක්‍රලේඛ අවශ්‍යතාවයන්ට අනුකූල වන පරිදි ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළ යුතුය. | කොමිෂන් සභාවට 2018 වර්ෂයේදී තනි ශීර්ෂයක් යටතේ ප්‍රතිපාදන ලබා දීමට කටයුතු කිරීමෙන් පසු ඉදිරි කටයුතු පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය මූලික කටයුතු හැකි ඉක්මනින් ඉටු කර ගැනීමට අවශ්‍යයව තිබූ බැවින් යම් නිශ්චිත කාල පරිච්ඡේදයක් තුළදී ඉටු කරගත යුතු කාර්යයන් සැලසුම් කිරීම අපහසු විය. 2018 වර්ෂය තුළදී ඉටුකර ගත යුතු මූලික කාර්යයන් නිශ්චය කර ගත් අතර ඒ අනුව 2018 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමට සිදු විය.<br>කොමිෂන් සභාවේ ක්‍රියාකාරී සැලැස්ම 2014.02.17 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2014 ට අනුකූල නොවන අවස්ථා පවතින බව පිළිගන්න අතර එම අඩුපාඩු 2019 වර්ෂයේදී නිවැරදි කර ගනු ලැබේ. |

### 3.1.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

<table>
<tr><th></th><th>විගණන නිරීක්ෂණය</th><th>නිර්දේශය</th><th>ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම</th></tr>
<tr><td>(අ)</td><td>පනතේ 32(1)(ආ) වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාව විසින් අභියාචනා ලැබීමෙන් දින තිහක් ඇතුළත එම ඉල්ලීම අවශ්‍ය කටයුතු සඳහා තොරතුරු නිලධාරියාට යැවිය හැකිය. එසේ වුවද, එපරිදි ක්‍රියා කර නොතිබූ අවස්ථා නිරීක්ෂණය වූ අතර ඒ පිළිබඳ විස්තර පහත පරිදි විය.
<table>
<tr><th>කාල පරිච්ඡේදය / වර්ෂය</th><th>කොමිෂන් සභාව වෙත ලැබී ඇති අභියාචනා ප්‍රමාණය</th><th>2019.02.28 දිනට විභාග කරන ලද අභියාචනා ප්‍රමාණය</th><th>විභාග කරන ලද අභියාචනාවලින් ප්‍රකාශයට පත් කළ නියෝග ප්‍රමාණය</th></tr>
<tr><td>ආරම්භයේ සිට 2017.12.31 දක්වා</td><td>230</td><td>198</td><td>198</td></tr>
<tr><td>2018</td><td>800</td><td>549</td><td>549</td></tr>
<tr><td>2019.01.01 සිට 2019.02.28 දක්වා</td><td>200</td><td>22</td><td>10</td></tr>
</table></td><td>පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය.</td><td>ප්‍රායෝගිකව දින 30 ඇතුළත තීන්දුවක් ලබාදීම දුෂ්කර කාර්යයකි. කොමිෂන් සභාව වෙත ඉදිරිපත් වන සෑම අභියාචනාවක්ම නීතියේ ප්‍රතිපාදන සමඟ අධ්‍යයනය කර කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර අභියාචන විභාගය සඳහා දින නියම කරනු ලැබේ.</td></tr>
<tr><td>(ආ)</td><td>නියෝග රීති හා මහපෙන්වීම් ප්‍රකාශයට පත් කිරීමේ අරමුණින් 2018 වර්ෂය තුළදී 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 41 හා 42 වගන්තිය ප්‍රකාරව, අවශ්‍ය නීති රෙගුලාසි ප්‍රකාශයට පත් කිරීමට සැලසුම් කර තිබුණද, 2018 වර්ෂය තුළ නීති හෝ රෙගුලාසි කිසිවක් ප්‍රකාශයට පත් කර නොතිබුණි.</td><td>සැලසුම් කළ පරිදි, අදාල කාර්යයන් ඉටු කළ යුතුය.</td><td>ඉදිරියේදී අවශ්‍ය නව නීති රෙගුලාසි සම්පාදනය හෝ පවතින නීති රෙගුලාසිවල සංශෝධනයන් අවශ්‍ය පරිදි සිදු කිරීමට කටයුතු කළ හැකිය.</td></tr>
</table>

| | | | |
|---|---|---|---|
| (ඇ) | රාජ්‍ය අංශයේ ලේඛන කළමනාකරණය විධිමත් කිරීමට අදාළව කොමිෂන් සභාවේ රීති, රෙගුලාසි, මාර්ගෝපදේශ, ක්‍රියාපටිපාටි ප්‍රසිද්ධ කිරීම තුළින් ලේඛන කළමනාකරණය සඳහා 2018 වර්ෂය තුළදී පොදු අධිකාරින්ට උපදෙස් ලබාදීමට සැලසුම් කර තිබුණි. එසේ වුවද, ලේඛන කළමනාකරණ නියමයන් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය හා ජාතික ලේඛණාරක්ෂක දෙපාර්තමේන්තුව හා ඒකාබද්ධව කෙටුම්පත් කිරීමේ මූලික පියවර ආරම්භ කර ඇති බව හා පවත්නා ලේඛන කළමනාකරණ නීති හා ශිල්ප ක්‍රම පිළිබඳව නීති උපදේශකවරුන් විසින් අධ්‍යයන කටයුතු සිදු කරමින් පවතින බවත් අනාවරණය වුවද, කොමිෂන් සභාව විසින් අදාළ රීති, රෙගුලාසි, මාර්ගෝපදේශ, ක්‍රියාපටිපාටි ආදිය ප්‍රසිද්ධ කර නොතිබුණි. | සැලසුම් කළ පරිදි, අදාල කාර්යයන් ඉටු කළ යුතුය. | නියමයන් තවදුරටත් අධ්‍යයන කර අවශ්‍යතාවයන් හඳුනා ගැනීම දැනට කරමින් පවතී. |
| (ඈ) | ප්‍රගාමී තොරතුරු හෙළිදරව් කිරීම ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් 2018 වර්ෂය තුළදී එම තොරතුරු හෙළිදරව් කිරීමේ අන්තර්ගතයන් පිළිබඳ උපදෙස්/මගපෙන්වීම නිකුත් කිරීමට සැලසුම් කර තිබුණද, එම උපදෙස්/ මාර්ගෝපදේශවල ක්‍රියාත්මකභාවය පිළිබඳ පසුවිපරම් කිරීම් සිදු කර නොතිබුණි. | සැලසුම් කළ පරිදි, අදාල කාර්යයන් ඉටු කළ යුතුය. | ඉදිරියේදී ප්‍රගාමී තොරතුරු හෙළිදරව් කිරීම හෙළිදරව් කිරීම පිළිබඳව පසු විපරම් කටයුතු සිදු කිරීමට හා අදාල පොදු අධිකාරින් දැනුවත් කිරීම තුළික් ඒ සඳහා ප්‍රගාමී තොරතුරු හෙළිදරව් කිරීම ප්‍රවර්ධනය කිරීමට පියවර ලැනීමට අපේක්ෂා කෙරේ. |
| (ඉ) | 2018 දෙසැම්බර් වනවිට ප්‍රගාමී තොරතුරු හෙළිදරව් කිරීම ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් ඒ පිළිබඳව සැලසුම් කර අවම ප්‍රමිතීන් නිර්මාණය කිරීමට සැලසුම් කර තිබුණද, සැලසුම් කරන ලද පරිදි ක්‍රියාත්මක කර නොතිබුණි. | සැලසුම් කළ පරිදි, අදාල කාර්යයන් ඉටු කළ යුතුය. | ඉදිරියේදී ප්‍රගාමී තොරතුරු හෙළිදරව් කිරීම හෙළිදරව් කිරීම පිළිබඳව පසු විපරම් කටයුතු සිදු කිරීමට හා අදාල පොදු අධිකාරින් දැනුවත් කිරීම තුළින් ඒ සඳහා ප්‍රගාමී තොරතුරු හෙළිදරව් කිරීම ප්‍රවර්ධනය කිරීමට පියවර ගැනීමට අපේක්ෂා කෙරේ. |
| (ඊ) | රාජ්‍ය අංශයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතනවල වෙබ් අඩවි මඟින් ප්‍රගාමී තොරතුරු එළි දැක්වීම දියුණු කිරීමේ අරමුණින් 2018 දෙසැම්බර් වනවිට වෙබ් අඩවි සමීක්ෂණය කිරීම හා යාවත්කාලීන කිරීමට උපදෙස් යැවීමට සැලසුම් කර තිබුණද, එසේ ක්‍රියාත්මක කොට අදාළ පසුවිපරම් කටයුතු සිදු කර නොතිබුණි. | සැලසුම් කළ පරිදි, අදාල කාර්යයන් ඉටු කළ යුතුය. | ඉදිරියේදී ප්‍රගාමී තොරතුරු හෙළිදරව් කිරීම හෙළිදරව් කිරීම පිළිබඳව පසු විපරම් කටයුතු සිදු කිරීමට හා අදාල පොදු අධිකාරින් දැනුවත් කිරීම තුළින් ඒ සඳහා ප්‍රගාමී තොරතුරු හෙළිදරව් කිරීම ප්‍රවර්ධනය කිරීමට පියවර ගැනීමට අපේක්ෂා කෙරේ. |
| (උ) | සමාලෝචිත වර්ෂය තුළ කොමිෂන් සභාව විසින් එළිදැක්විය යුතු ප්‍රකාශයන්වල වියදම් පියවීම සඳහා රු. 1,500,000 ක විදේශ ප්‍රදාන යටතේ ප්‍රතිපාදන ලැබී තිබුණද, එය අදාල ව්‍යාපෘති වෙනුවෙන් යොදාගෙන නොතිබුණි. | ව්‍යාපෘතිය සඳහා වූ ප්‍රතිපාදන, අදාල අරමුණු සඳහා කඩිනමින් යෙදවිය යුතුය. | කොමිෂන් සභාව විසින් එළිදැක්විය යුතු ප්‍රකාශනයන් කිහිපයක වියදම් පියවා ගැනීම සඳහා රු.1,500,000 ක ප්‍රතිපාදන 2018 වර්ෂයේදී ලැබී තිබුනද, එම ග්‍රන්ථයන්හි පරිවර්තන කටයුතු හා සම්පත් දායක ලිපි |

| | | |
|---|---|---|
| | | ලැබීම් ප්‍රමාදවීම මත 12/31 දිනට පෙර මුද්‍රණය කිරීමට නොහැකි විය. |

### 3.1.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පනතේ 37(1) වගන්තිය ප්‍රකාර, එක් ලිත් වර්ෂයකට යටත් පිරිසෙයින් එක් වාර්තාවක් පිළියෙල වන සේ, කොමිෂන් සභාව විසින් එහි කටයුතු පිළිබඳ වාර්තා පිළියෙල කොට පිටපතක් කොමිෂන් සභාව විසින් පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවද, කොමිෂන් සභාව 2016 සඳහා වාර්තාවක් සභාගත කර නොතිබුණි. | පනත ප්‍රකාරව ක්‍රියා කළ යුතුය. | කොමිෂන් සභාව ආරම්භ කරනු ලැබුවේ 2016 ඔක්තෝම්බර් මාසයේ බැවින් 2016 වර්ෂය සඳහා විශේෂ වාර්තාවක් සකස් කර නොමැත. |

## 4. යහපාලනය

### 4.1 මහජනයා වෙත සේවා ඉටු කිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු. මිලියන 1.2 ක ප්‍රතිපාදන මත ග්‍රාමීය හා දුෂ්කර ප්‍රදේශවල ජනතාව දැනුවත් කිරීමේ අරමුණින් තෝරාගත් ප්‍රදේශ 8 ක ප්‍රජා සංවිධාන සමඟ එක් දින සාකච්ජා පැවැත්වීමට සැලසුම් කර තිබුණද, ඉන් 2019 මාර්තු වනවිට පවත්වා තිබුණේ වැඩසටහන් තුනක් පමණි. | සැලසුම් කළ පරිදි දැනුවත් කිරීම් සිදු කළ යුතුය. | මෙම ව්‍යාපෘතිය 2018 මැයි 01 වන දින සිට 2019 අගෝස්තු 30 වන දින දක්වා ක්‍රියාත්මක කරවීමට නියමිත ව්‍යාපෘතියකි. ප්‍රතිපාදනය ලද විට ඉතිරි වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. |

### 4.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (1) වගන්තිය ප්‍රකාරව, ආස්ථිත්‍යයන්හි | පනතේ විධිවිධාන ප්‍රකාරව, අභ්‍යන්තර විගණනයක් සිදු | ඉදිරියේදී අභ්‍යන්තර විගණකවරයකු පත් කිරීමට |

| | | |
|---|---|---|
| අභ්‍යන්තර විගණන සිදු කිරීම සඳහා එම ආස්ථිතායේ පාලක මණ්ඩලය විසින් යථා පරිදි පත් කරනු ලබන තමාගේම අභ්‍යන්තර විගණකවරයෙකු සිටිය යුතු වුවද, කොමිෂන් සභාව විසින් මෙතෙක් අභ්‍යන්තර විගණකවරයෙකු පත් කර නොතිබුණි. | කළ යුතුය. | අපේක්ෂා කෙරේ. |

## 4.3 විගණන හා කළමනාකරණ කමිටුව

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41 (1) වගන්තිය ප්‍රකාරව සෑම විගණනය කරනු ලබන ආස්ථිතායන් සඳහාම අවස්ථාවෝචිත පරිදි, අදාළ ප්‍රධාන ගණන්දීමේ නිලධරයා විසින් හෝ ගණන්දීමේ නිලධරයා විසින් හෝ අදාළ පාලක මණ්ඩලය විසින් තමාට සහාය දීම පිණිස පත් කරනු ලබන විගණන සහ කළමනාකරණ කමිටුවක් තිබිය යුතු වුවද, කොමිෂන් සභාව විසින් එවැනි කමිටුවක් පත් කර නොතිබීම හේතුවෙන් අස්ථිතායෙහි ක්‍රියාකාරීත්වයන් අඛණ්ඩ පදනමක් මත සමාලෝචනය කිරීමක් සිදු වී නොතිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව, පාලක මණ්ඩලය විසින් විගණන හා කළමනාකරණ කමිටුවක් පත් කළ යුතුය. | ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ පවත්නා විගණන සහ කළමනාකරණ කමිටුව යටතේ කොමිෂන් සභාවේ කටයුතු සමාලෝචනය යෝග්‍ය වන්නේ නම් එසේ කිරීමටත් නැතිනම් එකී කමිටුවක් එම අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරීගේ සහභාගිත්වයෙන් පිහිටුවීමටත් අපේක්ෂා කෙරේ. |

## 5. මානව සම්පත් කළමනාකරණය

### 5.1 කොමිෂන් සභාවේ අනුමත කාර්ය මණ්ඩලය හා තථ්‍ය කාර්ය මණ්ඩලය

කොමිෂන් සභාවේ 2018 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩලය පිළිබඳ නිරීක්ෂණ පහත පරිදි වේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පනතේ 13(1)(අ) වගන්තිය ප්‍රකාර, කොමිෂන් සභාවේ ප්‍රධාන විධායක නිලධාරියා වන අධ්‍යක්ෂ ජනරාල් තනතුර 2019 පෙබරවාරි සිට විගණිත දිනය වනවිටත් පුරප්පාඩුව පැවතුණි. | කොමිෂන් සභාවේ ප්‍රධාන විධායක නිලධාරි තනතුරු පුරප්පාඩුව හැකි ඉක්මනින් පිරවීමට කටයුතු කළ යුතුය. | 2019.06.04 වන දින අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා බඳවා ගැනීමට අදාල සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමට කටයුතු යොදා ඇත. |
| (ආ) | කොමිෂන් සභාවට අදාලව ගණකාධිකාරී තනතුරක් අනුමත කරවා ගෙන නොතිබුණු අතර විගණිත දිනය වනවිටත් මූල්‍ය නිලධාරියෙකු මගින් මූල්‍යමය පරිපාලන කටයුතු හා ගිණුම් පිළියෙල කිරීම සිදුකර තිබුණි. | කොමිෂන් සභාවට අදාලව ගණකාධිකාරී තනතුරක් අනුමත කරවා ගත යුතුය | මේ වන විට ගණකාධිකාරී තනතුරක් අනුමත කරවා ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතින් අනුමතිය ලබා ගැනීම සඳහා ලිපියක් සකස් කරමින් පවතී. |
| (ඇ) | 2019 මැයි 22 වන විට අනුමත තනතුරු සංඛ්‍යාවෙන් තනතුරු 06 පුරප්පාඩුව පැවතුණි. | තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කළ යුතුය. | පර්යේෂණ නිලධාරි සහ භාෂා පරිවර්ථක (දෙමළ) යන තනතුරු සඳහා බඳවා ගැනීමට අදාළ සම්මුඛ පරීක්ෂණ ද කඩිනමින් පැවැත්වීමට අපේක්ෂා කෙරේ.<br>එසේම 2018.12.3 දිනට පුරප්පාඩුව පැවති සංවර්ධන නිලධාරි තනතුර සඳහා මේ වන විටත් බඳවා ගැනීම් සිදු කර අවසන් කර ඇත.<br>කළමනාකරණ සහකාර, රියදුරු සහ කාර්යාල කාර්ය සහයක පුරප්පාඩු තනතුරු සඳහාද බඳවා ගැනීම් කටයුතු මේ වර්ෂය තුල සිදු කිරීමට අපේක්ෂා කෙරේ. |
| (ඈ) | කොමිෂන් සභාවේ පරිපාලන නිලධාරි තනතුර සඳහා 2016 ඔක්තෝබර් 20 දින වයස අවුරුදු 60 ඉක්මවූ නිලධාරියෙකු පත් කර තිබුණි. එසේ වුවද, අංක 09/2007(1) හා 2007 අගෝස්තු 24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ (ii) වගන්තිය ප්‍රකාරව, අනුප්‍රාප්තිකයෙකු පත් කිරීමට අපහසු වූද, වැඩබැලීම වැනි විකල්ප ක්‍රියාමාර්ග මඟින් දැනට සේවයේ සිටින නිලධාරීන්ගෙන් ඉටුකර ගත නොහැකි වූද, අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ/ දෙපාර්තමේන්තු | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ක්‍රියා කළ යුතුය. | නිලධාරියෙකු තෝරා ගැනීමට තරම් ප්‍රමාණවත් කාලයක් නොමැති වීම හේතුවෙන් සහ කොමිෂන් සභාවේ ඉදිරි කටයුතු කරගෙන යාමට පරිපාලන නිලධාරියෙකු බඳවා ගැනීම අත්‍යාවශ්‍ය කරුණක් වූ බැවින් මෙම ආයතනයේ පත්වීම් බලධාරියා වන කොමිෂන් සභාවේ අනුමැතිය මත අදාල සුදුසුකම් සපුරන ලද විශ්‍රාමික නිලධාරියෙකු පරිපාලන නිලධාරි තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන ඇත. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රධානීන්ගේ පෞද්ගලික නිර්දේශය මත විශ්‍රාමික නිලධාරියෙකු මාස 12 ක උපරිමයකට යටත්ව පත් කළ හැකි වුවද, මෙම පරිපාලන නිලධාරියා 2018 සැප්තැම්බර් 30 දක්වා එනම් වසර 2 ක පමණ කාලයක් සඳහා රු. 890,121 ක ගෙවීම් මත අඛණ්ඩව සේවයේ නියුක්ත කර තිබුණි. | | දෙවන වර්ෂය අවසන් වන තෙක් පමණක් එම නිලධාරියා සේවයේ නියුතු විය. |
| (ඉ) | කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) සේවා ගණයට අදාළ අනුමත බඳවා ගැනීමේ පටිපාටිය අනුව අ.පො.ස (සා.පෙළ) විභාගයේදී සිංහල/දෙමළ, ගණිතය හා ඉංග්‍රීසි භාෂාව යන විෂයයන් 06 කින් සමත්ව තිබිය යුතු වුවද, එම සුදුසුකම් සපුරා නොතිබුණු නිලධාරීන් දෙදෙනෙකු සේවයේ යොදවා තිබුණි. | අනුමත බඳවා ගැනීමේ පරිපාටිය ප්‍රකාරව බඳවා ගැනීම් සිදු කළ යුතුය. | කොමිෂන් සභාවේ මූලාරම්භයේ සිට සේවයේ යෙදී සිටි මෙම නිලධාරිනියන් දෙදෙනා සුදුසුකම් සම්පූර්ණ නොකිරීම මත සේවයෙන් ඉවත් කිරිම මානුෂීය වශයෙන් ද සලකා බලන විට සුදුසු නොමැති බැවින් එම සුදුසුකම් සම්පූර්ණ කළ පසුව සේවය ස්ථිර කිරීමේ පදනම මත මෙතෙක් සේවයේ රඳවාගෙන ඇත. |